සැ. යු. - 2013.10.25 දින පළ වූ අංක 1,834 දරන ගැසට් පත්‍රයේ I: III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,835 - 2013 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2013.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 1730 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — |
| බඩු බාහිරාදිය විකිණීම් | 1731 |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | — |
| රජයේ නොවන දැන්වීම් | 1733 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | 1737 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2013 නොවැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : SRS/F. 7077

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

**මාලිගාවත්ත, හයිඩ්‍රොලික් ලොකොමෝටිව් ෂෙඩ් (HLS) හි CNC අන්ඩර් ෆ්ලෝ, වීල් ලේත් මැෂින් (වීල් ට්‍රැයින් මැෂින්) එකක් සැපයීම**

*ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා ප්‍රසම්පාදනය*

ප්‍රසම්පාදන අංකය : SRS/F.7077

ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 01 හි, ප්‍රවාහන අමාත්‍යාංශයේ, ස්ථාවර කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයට අන්ඩර් ෆ්ලෝ වීල් ලේත් මැෂින් (වීල් ට්‍රැයින් මැෂින්) එකක් සැපයීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. නිෂ්පාදකයින්ට, සිය ඇටර්නි බලය පැවරීම මගින් බලවත් කරන ලද බලයලත් නියෝජිතයින් මගින් ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. 2013 නොවැම්බර් මස 19 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වේ.

03. ශ්‍රී ලංකා රුපියල් දස දහසක (රු. 10,000.00) ක ගාස්තුවක් ගෙවීමෙන්, (ශ්‍රී ලංකා වේලාවෙන්) පැය 9.00 සිට පැය 15.00 දක්වා අතරතුර, 2013 ඔක්තෝබර් මස 07 වැනි දින සිට 2013 නොවැම්බර් මස 18 වැනි දින දක්වා, සාමාන්‍ය රාජකාරි දිනවල දී, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලංසුකරණ ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘති පත්‍ර මත ලංසු ඉදිරිපත් කළ යුතු ය. විදේශීය ලංසුකරුවන් හට, ඉහත නියමිත දිනවල, පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි විදේශ මුදල් වර්ගයකින්, ශ්‍රී ලංකා රුපියල් දස දහසක (රු. 10,000.00) මුදලක් ස්වකීය රටවල ශ්‍රී ලංකා දූත (තානාපති) කාර්යාලවලට ගෙවා ලංසුකරණ ලිපිලේඛන තමන් හට ලබා දෙන ලෙස, (එවන ලෙස) ශ්‍රී ලංකාවේ දූත (තානාපති) කාර්යාලය හරහා, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි වෙතින් ඉල්ලා සිටිය යුතු ය. ඉහත සඳහන් ශ්‍රී ලංකා රුපියල් දස දහසක (රු. 10,000.00) ප්‍රසම්පාදන ගාස්තුව, (හෝ පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි විදේශ මුදල් වර්ගයකින් සමාන වටිනාකමට වන මුදලක්) ආපසු ගෙවනු නොලබන ගාස්තුවකි.

04. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01 හි, ප්‍රවාහන අමාත්‍යාංශයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,  
ස්ථාවර කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව,  
ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,  
කොළඹ 10,  
ශ්‍රී ලංකාව.

06. ලංසුකරණ ලිපි ලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,  
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,  
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,  
කොළඹ 10, ශ්‍රී ලංකාව.  
දුරකථන : 94 (11) 2438078 හෝ 94 (11) 2436818  
ෆැක්ස් : 94 (11) 2432044  
ඊමේල් : srs.@railway.gov.lk, gmrslr@sltnet.lk  
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,  
ස්ථාවර කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව,  
ප්‍රවාහන අමාත්‍යාංශය.

11-86

---

**මහාධිකරණය - පොළොන්නරුව**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත සඳහන් රථවාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට පොළොන්නරුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. විකිණීමට අදාළ රථවාහන පහතින් දක්වා ඇති ස්ථානයේ දී 2013.11.01 වැනි දිනට පසු අදාල අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර, මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි පොළොන්නරුව මහාධිකරණය මගින් 2013.11.01 වැනි දින සිට 2013.11.15 දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන ලද රු. 100 ක පෝර්ම ගාස්තුවක් පොළොන්නරුව මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව ත්‍රිරෝද රථය සඳහා රු. 5,000 ක සහ අනිකුත් රථ සඳහා එක් එක් රථයට රු. 7,000 බැගින් ආපසු ගෙවන තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අනිකුත් විස්තර සහ කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග සපයනු ලැබේ.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගතයුතු නිලධාරියා |
|---|---|---|---|---|
| 01. | 86374 | අංක EPGU 8516 මැස්ඩා ටිපර් රථය | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, පොළොන්නරුව | රෙජිස්ට්‍රාර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය පොළොන්නරුව |
| 02. | 89032 | WPPQ 4364 මහේන්ද්‍රා කැබ් රථය | එම | එම |
| 03. | බී. 1148/06 (එච්. සී. 03/11) | එන්. සී. එච්. ඉසඩ් 1915 ත්‍රී රෝද රථය | එම | එම |

ධම්මික ගනේපොල,
මහාධිකරණ විනිසුරු,
පොළොන්නරුව.

2013 ඔක්තෝබර් මස 09 වැනි දින,
පොළොන්නරුව මහාධිකරණයේ දී ය.

11- 02

# බඩු බාහිරාදිය විකිණීම්

### දිසා අධිකරණය - ගම්පොල

රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා ගොඩනැගිල්ල අලුත්වැඩියාවේදී ගලවා ඉවත් කළ භාණ්ඩ සහ භාණ්ඩ වට්ටෝරු පොතෙන් ඉවත් කළ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ, භාණ්ඩ වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ සහ ගොඩනැගිල්ල අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ 2013.12.28 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතු යි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එච්. කේ. එන්. පී. අල්විස්,
දිසා විනිසුරු.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
ගම්පොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒආර් 679/01 | බර ග්‍රෑම් 16.20 වන චේන් (ඩයමන්ඩ්) | 01යි |
| 02. | ඒආර් 679/04 | බර ග්‍රෑම් 9.40 වන චේන් (කැරලි) | 01යි |
| 03. | ඒආර් 679/04 | බර ග්‍රෑම් 4.30 වන මුදු | 01යි |
| 04. | ඒආර් 679/04 | බර ග්‍රෑම් 5.50 වන පෙන්ඩන්ට් | 01යි |
| 05. | බී 452/05 | බර ග්‍රෑම් 12.10 වන ගල් සහිත පෙන්ඩන්ට් (රන් නොවන ආභරණ) | 01යි |
| 06. | බී 2474/08 | බර ග්‍රෑම් 1.3 වන ගල් සහිත මුදු | 01යි |
| 07. | බී 2474/08 | බර ග්‍රෑම් 0.95 වන මුදු | 01යි |
| 08. | බී 2474/08 | බර ග්‍රෑම් 0.66 වන ගල් සහිත පෙන්ඩන්ට් | 01යි |
| 09. | බී 2474/08 | 1. බර ග්‍රෑම් 1.66 වන කරාබු ජෝඩු | 04යි |
| | | 2. ගලක් සහිත කරාබු | 01යි |
| 10. | 78769 | බර ග්‍රෑම් 16.08 වන වළලු (රන් නොවන ආභරණ | 02යි |
| 11. | ඒආර් 6110/12 | අංක ඒ 00273 දරන ෆිලිප්ස් වර්ගයේ පාපැදි | 01යි |
| 12. | ඒආර් 6179/12 | තාර සහිත තාර බැරල් | 01යි |
| 13. | 29253 | හන්ටර් වර්ගයේ අංක බීජී - 305 ඒ දරන වල් කපන යන්ත්‍ර | 01යි |
| 14. | 29253 | අළු පාට සොනිකා වර්ගයේ ඩී. වී. ඩී. යන්ත්‍ර | 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 15. | 10978 | සීරියල් අංක සීඑම්වී 17606/29 දරන මෝටර් | 01යි |
| 16. | 10978 | අංක 5480 එන්ඩී 132 එම් දරන මෝටර් | 01යි |
| 17. | 10978 | අංක ඩීසී 160 එම්එන් 5578 එන් දරන මෝටර් | 01යි |
| 18. | 10978 | අංක එස්වීජ්එන්/සීබී 8660 දරන මෝටර් | 01යි |
| 19. | 10978 | අංක 5287 එන් වෝල්ට් 380-420 දරන මෝටර් | 01යි |
| 20. | 71005 | සවල් | 01යි |
| 21. | 78311 | සවල් | 01යි |
| 22. | 81193 | පැදුරු | 01යි |
| 23. | 81194 | පැදුරු | 01යි |
| 24. | 81052 | හිසේ පැළඳිය හැකි විදුලි පන්දම් | 01යි |
| 25. | 80781 | යකඩ කම්බි | 01යි |
| 26. | 80782 | යකඩ කම්බි | 01යි |
| 27. | 81256 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01යි |
| 28. | 83106 | තහඩු බැරල් | 01යි |
| 29. | 81602 | කුඩා තහඩු බැරල් | 01යි |
| 30. | 82232 | ගමන් මලු | 01යි |
| 31. | 27432 | 1. අභ්‍යාස පොත් | 03යි |
| | | 2. පාට පෙට්ටි | 01යි |
| 32. | අංක රහිත | ප්ලාස්ටික් කෑන් තොගයක් | |
| 33. | අංකරහිත | වීදුරු බෝතල් තොගයක් | |
| 34. | - | භාවිතයෙන් ඉවත් කළ වයර් රෝල් | 01යි |
| 35. | - | භාවිතයෙන් ඉවත් කළ ග්‍රීසර් 01ක් සහ එහි කොටස් කීපයක් | |
| 36. | - | අධිකරණයේ නම සඳහන් පුවරු 01ක් සහ එහි යකඩ බට 03ක් | |
| 37. | - | භාවිතයෙන් ඉවත් කළ පියන සහිත උළුවහු | 01යි |
| 38. | - | භාවිතයෙන් ඉවත් කළ ජනෙල් පියන් | 04යි |
| 39. | - | භාවිතයෙන් ඉවත්කළ පියන් සහිත ජනෙල් | 04යි |
| 40. | - | භාවිතයෙන් ඉවත් කළ ලී භාණ්ඩවල කැඩී ගිය ලී කැබලි තොගයක් | |
| 41. | - | කොටස්වලට වෙන් වූ ලී අල්මාරියක කොටස් | |
| 42. | - | භාවිතයෙන් ඉවත්කළ ලාච්චු 04ක් සහිත වානේ ෆයිල් කබඩ් | 01යි |
| 43. | - | අංක 603089 දරන ෆැසිට් වර්ගයේ සිංහල යතුරු ලියන | 01යි |
| 44. | - | අංක 177364 දරන ෆැසිට් වර්ගයේ සිංහල යතුරු ලියන | 01යි |
| 45. | - | අංක 164893 දරන ඔප්ටිමා වර්ගයේ සිංහල යතුරු ලියන | 01යි |
| 46. | - | අංක 724624 දරන ෆැසිට් වර්ගයේ ඉංග්‍රීසි යතුරු ලියන | 01යි |
| 47. | - | අංක 575098 දරන ෆැසිට් වර්ගයේ සිංහල යතුරු ලියන | 01යි |



## මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර

### අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාල රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2013.11.30 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුයි. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

අරුණ අලුත්ගේ,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කළුතර.

2013 සැප්තැම්බර් මස 24 වැනි දින,
කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1. | AR 3423/13 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 2. | AR 3446/13 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 3. | AR 3422/13 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 4. | AR 3447/13 | මවුන්ටන් වර්ගයේ පාපැදිය |
| 5. | - | අංක රහිත පාපැදිය |
| 6. | - | අංක රහිත අබලන් පාපැදිය |
| 7. | AR 36/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 8. | - | අංක රහිත පාපැදිය |
| 9. | - | අංක රහිත පාපැදිය |
| 10. | - | අංක රහිත පාපැදිය |
| 11. | - | අංක රහිත අබලන් පාපැදිය |
| 12. | - | අංක රහිත පාපැදිය |
| 13. | 2074 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 14. | AR 2075 | දිරාපත් පාපැදිය |
| 15. | AR 4140/13 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 16. | AR 4363/13 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 17. | AR 1792/12 | දිරාපත් පාපැදිය |
| 18. | AR 1704/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 19. | AR 1704/02 | දිරාපත් පාපැදිය |
| 20. | AR 1706/12 | අබලන් පාපැදිය |
| 21. | AR 1699/12 | අබලන් පාපැදිය |
| 22. | AR 1714/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |

| | | |
|---|---|---|
| 23. | AR 1698/12 | දිරාපත් පාපැදිය |
| 24. | AR 1705/12 | දිරාපත් පාපැදිය |
| 25. | AR 1701/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 26. | AR 1712/12 | දිරාපත් පාපැදිය |
| 27. | AR 1715/12 | දිරාපත් පාපැදිය |
| 28. | AR 1711/12 | දිරාපත් පාපැදිය |
| 29. | AR 1707/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 30. | AR 1716/12 | අබලන් පාපැදිය |
| 31. | AR 1708/12 | අබලන් පාපැදිය |
| 32. | AR 1710/12 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදිය |
| 33. | AR 17003/12 | යමහා චැපි වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක.) |
| 34. | AR 1713/12 | WPUA/9234 බජාජ් ඩිස්කවරි යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) |
| 35. | 14842 | TVS වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 36. | AR 1370/12 | හොණ්ඩා MTX වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 37. | - | නඩු අංක රහිත ඕලුගා වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 38. | - | නඩු අංක රහිත යමහා වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 39. | AR 1702/12 | යමහා චැපි වර්ගයේ අංක රහිත යතුරු පැදිය (ලියාපදිංචි කළ නොහැක) |
| 40. | 00528 | වර්ගය හා අංකය අපැහැදිලි අත් ට්‍රැක්ටරය (ලියාපදිංචි කළ නොහැක) |
| 41. | - | අංක රහිත සිලින්ඩරාකාර යකඩ උපකරණයක් |
| 42. | - | අංක රහිත කම්බි කැබලි කිහිපයක් |
| 43. | 15410 | 3572760445505 දරන සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය |
| 44. | 12171 | 358235033795626 දරන නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 45. | 11104 | 359172047889625 දරන ෆෝම්ස් වර්ගයේ ජංගම දුරකථනය |
| 46. | 13912 | අංකය සඳහන් නොකරන නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 47. | 09312 | බර්ඩ් වර්ගයේ කළු හා අළු පැහැති ජංගම දුරකථනය |
| 48. | 09425 ( BR 7450/12) | (i) 12.05 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01<br>(ii) 37.05 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් 01<br>(iii) ගෑස් ලිප් 03 |
| 49. | - | අංක රහිත යකඩ බාල්දි 03 |
| 50. | 62226 (BR 8582/08) | පොරවක් |
| 51. | - | අංක රහිත ප්ලාස්ටික් බාල්දි 02 |
| 52. | 10464 | තරාදි 01 |
| 53. | - | අංක රහිත මන්නා පිහි 01 |
| 54. | BR 5757 | 205-9808 බජාජ් වර්ගයේ දිරාපත් ත්‍රිරෝද රථය (ලියාපදිංචි කළ නොහැක) |
| 55. | - | නඩු අංක රහිත වාහන වර්ගය හා අංකය සොයාගත නොහැකි සම්පූර්ණයෙන් දිරාපත්ව කොටස් පමණක් ඇති වාහනයක් (ලියාපදිංචි කළ නොහැක) |
| 56. | 10729 | අංක SB 8028 දරන අත් ට්‍රැක්ටර් 01 (ලියාපදිංචි කළ හැක) |

කාර්යාල උපකරණ :

1. දිරාපත් තේක්ක අල්මාරි 01
2. දිරපත් ෆිල්ටර් ස්ටෑන්ඩ් 01
3. දිරාපත් පුටු 05
4. දිරාපත් ඇදි සහිත බංකු 01
5. ඝණක යන්ත්‍ර 03
6. නිල රථයෙන් ඉවත් කරන ලද ටයර් 04 (POTENZA REOBO වර්ගයේ)

11-01

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය.

සමාගමේ නම : ෂින්කායි හෝල්ඩිංස් කම්පනි (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 94791
සංස්ථාගත කළ දිනය : 2013.10.02
ලියාපදිංචි කාර්යාලය : අංක 175 සී, හල්මුල්ල, කොටුවිල, වැල්ලම්පිටිය.

ලේකම්.

11-34

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඕ කේ පාක්කියනාදන් අරිඟර්සෝලෙ (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : PV 94713
ලියාපදිංචි කළ දිනය : 2013 සැප්තැම්බර් මස 25 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 64, කදිර්ගාමර් පාර, අමර්තකලි, මඩකලපුව.

සමාගම් ලේකම්.

11-43

## සියලු දෙනාම දැනගත යුතුයි

ත්‍රිකුණාමලයේ අංක 272 4 කණුව, නුවර පාරේ පදිංචි අරුක්කටු පටබැඳිගේ චමින්ද අරුණ කුමාර වන මා විසින් ත්‍රිකුණාමලයේ අංක 09, පොලිස් නිවාස, පරණ පොලිසියේ පදිංචි විමලදාසගේ අශෝක් සමරනායක යන අයට මා විසින් පවරන ලද ඇටෝර්නි බලපත්‍රය නීතිඥ ආරුමුගම් ජෙගජෝති මහතා විසින් පිළියෙල කරන ලද දිනය 2007.11.15 අංක 3567 දරන ඇටෝර්නි බලපත්‍රය/ අවලංගු කළ බවට ප්‍රකාශ කරමි. එනම් 2012.10.25 වැනි දින සිට ඉහත අංක 3567 ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරමි.

11-32

---

## වගකීමෙන් සීමිත ප්‍රසිද්ධ සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : කුමාර අල්විස් ඩබ්ලිව්. පී. සී. ඊ. ඉන්ටෙග්‍රේටඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 94756
සංස්ථාගත කිරීමේ දිනය : 2013.09.27
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 161, එගොඩඋයන, මොරටුව.

සමාගම් ලේකම්වරුන්.

11-48

---

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සිම්ප්ලි බතික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 94636
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 25 සී, ස්ට්‍රැට්ෆර්ඩ් ඇවිනිව්, කොළඹ 06
සංස්ථාගත කළ දිනය : 2013 සැප්තැම්බර් මස 23 වැනි දින.

එස්. එම්. ආර්. ෆර්නැන්ඩො,
අධ්‍යක්ෂක.

11-03

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කුලීගොඩ, උස්මුදුලාව, "වලිමුනි සෙවන" හි පදිංචි හල්ජෝති සරත් ප්‍රියන්ත ද සිල්වා (ජා. හැ. අංක 701822390 V) වන මම රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ 20 කාණ්ඩ 6 පත් ඉරුවේ දින පොත් අංක 1318 හා වර්ෂ 2009.10.15 වැනි දින ලියාපදිංචි කරන ලද, වර්ෂ 2009.09.05 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් ලියන ආරච්චි වංශවතී මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 83 දරන ඇටර්නි බලපත්‍රය මගින් ශ්‍රී ලංකාවේ කුලීගොඩ, උස්මුදුලාව, "වලිමුණි සෙවන" හි පදිංචි වලිමුනි තුසිතා කල්‍යාණි මැන්ඩිස් (ජා. හැ. අංක 557372202 V) වෙත පවරනු ලැබූ ඉහත කී ඇටර්නි බලය මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවත්, මෙහි සඳහන් දිනයට පසුව එළඹෙන දිනයක මා වෙනුවෙන් ඉහත සඳහන් ඇටර්නි බලලාභී මෙම කරුණට මා බැඳී නොසිටින බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොදු ජනතාවට මෙයින් දන්වා සිටිමි.

හල්ජෝති සරත් ප්‍රියන්ත ද සිල්වා.

2013 ඔක්තෝබර් මස 08 වැනි දින.

11-05

---

## දැන්වීමයි

පහත විස්තර සඳහන් පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : පවර් ස්කයි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත අංකය : පී. වී. 85340
සංස්ථාගත දිනය : 2012.04.04
ලියාපදිංචි කාර්යාලය : අංක 136/1, ඇවරිවත්ත පාර, වත්තල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දූෂානි වික්‍රමසිංහ.

11-138

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ජින්දාල් ෆිල්මිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය : පී වී 95008

දිනය : 2013.10.11

ලියාපදිංචි ලිපිනය : අංක 172, අළුත්කඩේ වීදිය, කොළඹ 12

සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී. /(2) 2013/311

11-118

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී/ස ආච්ටයිප් (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී. වී. 94287
ලියාපදිංචි කළ දිනය : 2013.08.30
ලියාපදිංචි ලිපිනය : 165 ඒ, පාර්ක් පාර, කොළඹ 05.

සමාගම් අධ්‍යක්ෂක.

11-99

---

**සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය පී වී 4288

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම**

සමාගමේ නම : සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 6, බංගලාවත්ත පාර, මාබෝල, වත්තල
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 02/2013/CO
ඇවරකරුගේ නම : ජී. ජේ. ඩේවිඩ්,
ලිපිනය : ඇවරකරු
SJMS ඇසෝසියේට්ස් බාරේ, ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්, 4 වැනි මහල, අංක 02, කාසල් පටුමග, කොළඹ 04
පත්වීමේ දිනය : 2013 ජූලි මස 12.

11-97/1

---

**සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්**
සමාගමේ ලියාපදිංචි අංකය පී වී 4288

2007 අංක 07 දරන සමාගම් පනතේ XII යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 6, බංගලාවත්ත පාර, මාබෝල, වත්තල
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 02/2013/CO
නියෝගය දුන් දිනය : 2013 ජූලි 12
පෙත්සම ඉදිරිපත් කළ දිනය : 2013 ජනවාරි 04
ඇවරකරුගේ නම : ජී. ජේ. ඩේවිඩ්,
ලිපිනය : ඇවරකරු
SJMS ඇසෝසියේට්ස් බාරේ, ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්, 4 වැනි මහල, අංක 02, කාසල් පටුමග, කොළඹ 04

11-97/2

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නාමය 2013 සැප්තැම්බර් මස 27 දා සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමි.

පෙර නාමය : කොන්ෆිෆි ලෙෂර් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
නව නාමය : උටෝපියා ලෙෂර් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 70485
ලියාපදිංචි ලිපිනය : අංක 33, ශාන්ත මයිකල් මාවත, කොළඹ 03

කොන්ෆිෆි මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරුන්.

11-96

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

සමාගමේ නම : එස්. එම්. අයි. ඩී. එෆ්. යූන් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92060
සංස්ථාගත කළ දිනය : 2013 අප්‍රේල් මස 11 වැනි දින
ලියාපදිංචි ලිපිනය : සයුම්යාපාය, රත්මලී, උහුමීය.

11-92

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව

සමාගමේ නම : මාසු ලංකා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 94569
ලියාපදිංචි ලිපිනය : අංක 07, ඥානවිමල මාවත, හොරේතුඩුව, මොරටුව
ලියාපදිංචි දිනය : 2013.09.16

අධ්‍යක්ෂක.

11-71

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳව නිවේදනය කිරීම**

සමාගමේ නම : කාලිශක්ති බිස්නස් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 93089
ලියාපදිංචි කාර්යාලය : අංක 26, පැල්මයිරා ඇවනියුව්, කොළඹ 03

කාලිශක්ති බිස්නස් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරුන්.

11-70

## නිවේදනයයි

යුනිවර්සල් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 2013 සැප්තැම්බර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යුනිවර්සල් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 94719
ලියාපදිංචි කාර්යාලය : අංක 52, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7.

11-76

## නිවේදනයයි

සීලෑන් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් 2013 සැප්තැම්බර් මස 3 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සීලෑන් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 94354
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
සීලෑන් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්.

11-75

---

## දැන්වීමයි

නොරාටෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම

නොරාටෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙන අතර, 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1) (අ) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකයක් 2013 ඔක්තෝබර් මස 02 වැනි දින නිකුත් කර තිබෙන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කළ සමාගමේ නම : නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්, පීවී 3738
ඒකාබද්ධ කළ සමාගමේ ලියාපදිංචි කරන ලද ලිපිනය : තැ. පෙ. අංක 15, II වැනි අදියර, කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
කළමණාකාර අධ්‍යක්ෂ.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින.

11-77

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| හොරස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94297 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| සබාන් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 93984 | එම |
| ඒසීරෝසීරෝ කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94414 | 58, පල්ලිය වීදිය, ගාල්ල කොටුව, ගාල්ල |
| මිඩ්ල් ස්ට්‍රීට් ෆෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94618 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| චයිනා ලංකා ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94677 | අංක 187/71, ජයසමගි මාවත, කලුබෝවිල, දෙහිවල |
| මිඩ්ල් ස්ට්‍රීට් ෆෝට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94766 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ලොටස් ෆෝහන්ඩ්‍රඩ්ඇන්ඩ්ෆිෆ්ටිසික්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 94800 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| කියු ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 93498 | අංක 01, ආනපාල ඌෘතු, පිල්ලයාඩි, පුත්තලම. |

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,

අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05,

11-78

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අළුත්ගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණේ, අළුත්ගම බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභාවේ මාලේවන බැද්ද උප කාර්යාල සීමාව තුළ, කලුවා මෝදර පිහිටි කලවිලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් සාදන ලද 1989 නොවැම්බර් මස 10 දාතම හා අංක 914 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස, ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 20.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය* .- බේරුවල නගර මධ්‍යයේ සිට පිහිටි පෞද්ගලික බොරළු පාරේ "ලැගුම් ගාඩ්න් ගෙස්ට් හවුස් ඇන්ඩ් රෙස්ටුරන්ට්" දක්වා ගමන් කොට වම් පස එම ගෙස්ට් හවුසිය ඉදිරිපිට ම ඇති එම දේපළ වෙත ළඟා වන්න.

සිංහාර ජගත් තිලංග සහ ඇන්තෝනිදුර මංජුලා නිශාන්ති සිල්වා යන අයට ලබා දුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත උකස් කරන ලද දේපළ 2013 නොවැම්බර් මස 26 වැනිදා අඟහරුවාදා පෙ. ව. 11.30 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013 සැප්තැම්බර් මස 20 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* ද, "ඩේලි මිරර්" "ලක්බිම" සහ "තිනකරන්" පුවත් පත්‍ර බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල*.- සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු යි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාළ වේ නම් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ. හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපි ලේඛන කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව, පී. එල්. සී. සහකාර සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකි ය.

ඩී. කෙලාට් ඔක්ෂන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ වෙළෙන්දෝ.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස්,
දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.
දුරකථන අංක : 011- 4302622/011-4302623/ෆැක්ස් අංකය : 2856013.

11-144

---

## මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, හෙනරත්ගොඩ හි පිහිටි "කහටගහවත්ත නොහොත් කටහගහලන්ද" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ඩී. පී. රෙජිනෝල්ඩ් මහතා විසින් සාදන ලද 1996.02.03 දිනැති අංක 14/98 පිඹුරෙහි කැබලි අංක "1" හි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි බින්දුවක් (අ. 0 රූ. 0, පර්. 12.50) ක් හෙවත් හෙක්ටයාර් 0.036 ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි වැවිලි සහ සියලු දේත් සමග වේ.

02. ඉහත කී "හෙනරත්ගොඩ " පිහිටි "කහටගහවත්ත නොහොත් කහටගහලන්ද " නැමැති ඉඩමේ අංක 14/96 පිඹුරෙහි කැබලි අංක "2" හි ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතරයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 30.40) ක් හෙවත් හෙක්ටයාර් 0.0769ක් විශාලත්වය ඇති ඉඩම සහ එයට අයත් ගොඩනැගිලි වැවිලි සහ සියලු දේත් සමග වේ.

03. ඉහත කී "හෙනරත්ගොඩ " පිහිටි "කහටගහවත්ත නොහොත් කහටගහලන්ද " නමැති ඉඩමේ අංක 14/96 පිඹුරෙහි කැබලි අංක "3" හි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 3.10) ක් හෙවත් හෙක්ටයාර් 0.007ක් විශාලත්වය ඇති ඉඩම සහ එයට අයත් ගොඩනැගිලි වැවිලි සහ එයට අයත් සියලු දේත් වේ.

04. ඉහත කී "හෙනරත්ගොඩ " පිහිටි "කහටගහවත්ත නොහොත් කහටගහලන්ද " නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ මහතා විසින් සාදන ලද 1995.07.06 දිනැති අංක 1627 පිඹුරෙහි කැබලි අංක "5" හි ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 17.6) ක් හෙවත් හෙක්ටයාර් 0.0445 ක් විශාලත්වය ඇති ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි වැවිලි සහ එයට අයත් සියලු දේත් වේ.

සහ

ඉහතින් සඳහන් කරන ලද ඉඩම් වලට මාර්ග අයිතීන් ද සමග වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013.12.18 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* 2013.07.12 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල 2013.07.05 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම. - කොළඹ නුවර පාරේ මිරිස්වත්ත හන්දියේ සිට ගම්පහ පාරේ මීටර් 100ක් පමණ දුරක් ගමන් කිරීමේ දී මෙම දේපළට ළඟා වීමට පුළුවන. අදාළ දේපළ පිහිටා තිබෙන්නේ පාරේ වම් පැත්තේය. මිරිස්වත්ත ගම්පහ පාරෙන් කෙලින් ම පිවිසීමට හැකි ය.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ;

3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ;
4. ලිපිකරු හා නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90%ක් වූ (සියයට අනූවක්) මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ආයතනික බැංකු අංශය, තැ. පෙ. 437 ඒඑන්සීඑල් ගොඩනැගිල්ල, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 හි ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය) වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක : 011-2320651, 2320652, 2320653 ෆැක්ස් අංකය : 011 - 2448067.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය :* අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 011-2334808 (ෆැක්ස්)
දුරකථන (නිවස) 011- 2419126, 075- 0883265.

11-108

---

### මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ, කොට්ඨාස අංක 6 හි තලවතුගොඩ පාර වරිපනම් අංක 167 දරන ස්ථානයේ පිහිටි "කැකුණගහවත්ත නොහොත් මදටියාගහවත්ත" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 1992.06.28 දිනැති අංක 120 පිඹුරෙහි කැබලි අංක "1" හි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 01, පර්. 17.32) ක් විශාල ඉඩම ඊට අයත් ගොඩනැගිලි වැවිලි සහ ඊට අයත් සියලු දේ ද සමග වේ. (මෙය නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 3091/117 යටතේ ලියාපදිංචි කර ඇත)

ඉහත සඳහන් පිටකෝට්ටේ හි තලවතුගොඩ පාරේ පිහිටි "කැකුණගහවත්ත නොහොත් මදටියගහවත්ත" යයි කියනු ලබන ඉඩමෙහි කැබලි අංක "1" මෑතකදී කරනු ලබන මැනීමකට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාසයයි දශම දෙකයි බින්දුවක් (අ. 0, රූ. 01, පර්. 16.20) ක් විශාල ඉඩම වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2013.06.14 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල වර්ෂ 2013.06.07 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- මෙම දේපළට පිවිසීමට නම් පාගොඩ- නුගේගොඩ පාරේ කිලෝමීටර් 03ක් පමණ ගොස් පිටකෝට්ටේ හන්දියෙන් බැද්දගාන පාරට වමට හැරී කිලෝමීටර් 400ක් පමණ යන්න.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ;
4. ලිපිකරු හා නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90%ක් වූ (සියයට අනූවක්) මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ආයතනික බැංකුමය කටයුතු අංශය, ඒඑන්සීඑල් ගොඩනැගිල්ල, අංක 35 ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 හි ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය) වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක : 011-2320651, 2320552, 2320653 ෆැක්ස් අංකය : 011 -2448067.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය :* අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 011-2334808 (ෆැක්ස්)
දුරකථන (නිවස) : 011- 2419126, 075- 0883265.

11-107

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. එස්. පෙරේරා.
ගිණුම් අංක : 0187 5000 0920.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.03.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ හතලිස් දෙදහස් පන්සිය දහ අටයි ශත තිස් හතක (රු. 53,42,518.37) මුදල ද, 2013 ජුනි 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් අට ලක්ෂ හතලිස් දෙදහස් හත්සිය හතයි ශත එකොළහක (රු. 48,42,707.11) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාහතක් (17%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.10.25 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2013.10.10 වැනි දින "දිවයින" , සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2013.11.19 වැනි දින ප. ව. 3.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඹුරපොල පිහිටි "කඹුරපොල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ අතපත්තු යන අය විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 26 දාතම හා අංක 280/2011 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. එම්. ටිකිරිබණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : කඹුරපොල මහා විද්‍යාලයේ ඉඩම, දකුණට : අංක 681 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : කුලියාපිටියේ සිට හෙට්ටිපොල දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අ. 0 රූ. 1 පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 280/2011 දරන පිඹුරට අනුවය.

අංක 280/2011 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 1 වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කඹුරපොල පිහිටි "කඹුරපොල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 03 දාතම හා අංක 681 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. එම්. ටිකිරිබණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම වෙන් කෙරෙන කම්බි වැට, නැගෙනහිරට : කඹුරපොල මහා විද්‍යාලය වෙන් කෙරෙන කම්බි වැට දකුණට : අංක 681 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : කුලියාපිටියේ සිට හෙට්ටියපොල දක්වා ප්‍රධාන පාර වෙන් කෙරෙන කම්බි වැට යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 681 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ජේ 99/36 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-139/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එල්. ඒ. ඩී. එස්. එන්. අප්පුහාමි සහ එල්. ඒ. ඩී. ආර්. අප්පුහාමි.
ගිණුම් අංක : 1024 5335 1230.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.08.29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි ලක්ෂ අනූ එක් දහස් අටසිය හැට පහයි ශත දහ නමයක (රු. 2,091,865.19) මුදල ද, 2013 ජූලි 18 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහ නම ලක්ෂ තිස් පන් දහස් අසූ හතරයි ශත හැට පහක (රු. 19,35,084.65) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.10.25 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2013.10.09 වැනි දින "දිවයින" , සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2013.11.19 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ මීගමුව මහ නගර සභා සීමාවන් තුළ තලාහේන ග්‍රාමයේ පිහිටි පමුණුගම වටරවුම් හරස් පාර වරිපනම් අංක 769/25 ඒ දරන "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 මාර්තු මස 26 දාතම හා අංක 4963 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. ඩී. මෙරිල් සැම්සන් යන අයගේ ඉඩම, නැගෙනහිරට : පයස් මහදන ආරච්චි සහ ආර්. ටී. ස්ටැන්ලි කුවේජු යන අයගේ ඉඩම් වෙන් කෙරෙන කානුව, දකුණට : පාර සහ බස්නාහිරට : අඩි 6 පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4963 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 951/98 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-139/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය … … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| නොවැම්බර් | 2013.11.01 | සිකුරාදා | 2013.10.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.11.08 | සිකුරාදා | 2013.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.15 | සිකුරාදා | 2013.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.22 | සිකුරාදා | 2013.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.29 | සිකුරාදා | 2013.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2013.12.06 | සිකුරාදා | 2013.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.13 | සිකුරාදා | 2013.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.20 | සිකුරාදා | 2013.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.27 | සිකුරාදා | 2013.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2014** | | | |
| ජනවාරි | 2014.01.03 | සිකුරාදා | 2013.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.10 | සිකුරාදා | 2013.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.17 | සිකුරාදා | 2014.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.24 | සිකුරාදා | 2014.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.31 | සිකුරාදා | 2014.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.